# මායා තොප්පිය



තෙනුජී රෙහානා සමරතුංග ආරච්චි

# මායා තොප්පිය

## තෙනුජි රෙහානා සමරතුංග ආරච්චි

**(කතා)**

දෙවන දිගහැරුම

මහ/ උසස් බාලිකා විදුහල

මහනුවර

**7 ශ්‍රේණිය G**

**2026.05.10**

**ISBN : 978-624-211-018-9**

# පිදුම

කුඩා කල සිට

සෙනෙහසින් මා හැදූ වැඩූ

අම්මාට, අප්පච්චිට සහ නංගිට

මෙවන් අවස්ථාවක් උදා කර දුන්

මාගේ විදුහල් මෑණියටන්ට

මගේ මේ දෙවන වෑයම

උපහාරයක්ම

වේවා!

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඔන්න එකෝමත් එක රටක හිටියා පුංචි ගැහැණු ළමයෙක්. ඇයගේ නම සඳුනිය. එයා ජීවත් වුණේ එයාගේ අම්මායි, තාත්තයි, අත්තම්මා සහ නංගි සමඟය. ඇයගේ ගෙදරට හැමදාම ඇයගේ යාළුවෝ සෙල්ලම් කරන්න එනවා. ඒක නිසා සඳුනිට හරිම සතුටුයි.



සඳුනිගේ යාළුවා වන සමන්මලි විතරක් නෙවෙයි, ඇයගේ තව යාළුවෝ තුන් දෙනෙක් පැමිණෙනවා. ඔවුන්ගේ නම් රෝසි, සඳමාලි සහ මාලීය. ඔවුන් හතර දෙනාම සඳුනිගේ හොඳම යාළුවෝ ය.



ඔන්න එක දවසක් එක පාරටම හයියෙන් වැස්සා. ඒක නිසා සඳුනිගේ යාළුවන්ට සෙල්ලම් කරන්න බැරි වුණා. ඒක නිසා සඳුනිට සහ යාළුවන්ට හරිම දුකයි.



වැස්ස ඉවර වුනාට පසුව සඳුනිගේ යාළුවෝත් නැවතත් සෙල්ලම් කරන්න පටන් ගත්තා. ඒ කට්ටිය ඒ දවස්වල ගොඩාක් සෙල්ලම් කළා.

ඒ විතරක් නෙවෙයි සඳුනිගේ නංගිත් සෙල්ලම් කරන්න ඔවුන් සමඟ ආවා.

ඔන්න එක දවසක් සඳුනිට මායා තොප්පියක් ගැන මතක් වුණා. ඉන්පසු  සඳුනිට එය ඕනෑ වුණා. ඉන්පසු ඇය ඇයට මායා තොප්පියක් ඕනෑ කියා ඇයගේ යාළුවොන්ට කිව්වා. ඉන් පසු ඇයගේ යාළුවොත් එයට කැමති  වුණා.

ඇය සහ ඇයගේ යාළුවො මායා තොප්පිය ගැන සිහින මැව්වා.



ඔන්න ඒ දවසේ සෙල්ලම් කිරීම ද අවසන් වී සවස් කාලය උදා වුණා. ඔවුන් නිවෙස්වලට ගොස් රාත්‍රී ආහාරය රැගෙන නිදා ගැනීමට ගියා. පසුදා උදෑසන ඔවුන් උදේ ආහාරය රැගෙන පාඩම් කළා.

ඉන්පසුව සඳුනිගේ යහළුවෝ  වන සමන්මලි, රෝසි, සඳමාලි සහ මාලි සඳුනිගේ ගෙදරට සෙල්ලම් කරන්න ආවා. ඔවුන් හරිම ආසාවෙන් සෙල්ලම් කලා. ටික වෙලාවක් සෙල්ලම් කරමින් සිටියදි සඳුනිගේ අම්මා සඳුනිට කතා කලා,

"පුතේ අපේ ගෙදර අයටයි, ඔයාගේ යහළුවොන්ටයි කැළයට ගිහින් පළතුරු කඩාගෙන එන්න" අම්මා සඳුනිට කිව්වා. සඳුනි සඳුනිගේ නංගි සහ සඳුනිගේ යහළුවොත් සඳුනි එක්ක කැලයට පළතුරු කඩාගෙන ඒමට ගියා. සඳුනි සහ සඳුනිගේ යහළුවෝ පළතුරු කැඩීමට කැලෑවේ ගොඩාක් දුර ඇවිදගෙන ගියා.



මෙහෙම සඳුනි සහ සඳුනිගේ යහළුවෝ ඉස්සරහට ඇවිදගෙන යනකොට පොකුණක් ළඟ අඹ ගසක් තිබුණා. සඳුනි අඹ ගසෙන් ගෙඩි කූඩයකට කඩා ගත්තා.

සඳුනිට සහ සඳුනිගේ යහළුවන්ට හොඳටම මහන්සියි. ඒ නිසා සඳුනි ඇයගේ යහළුවන්ට සහ ඇයට අඹ ගෙඩි කඩා ගත්තා. ඔවුන් එම පොකුණෙන් මුහුණ සෝදා ගෙන අඹ ගෙඩිය ආහාරයට ගත්තා. ඉන් පසු ඔවුන් එම අඹ ගෙඩිය ආහාරයට ගෙන ඉදිරියට ඇවිදගෙන ගියා.

ඉදිරියට ඇවිදගෙන යන විට ඔවුන්ට ඉදිරියෙන් කහ පාට එළියක් මතු වි එතනින් සුරංගනාවියක් මතු වුණා. සුරංගනාවිය ඔවුන්ගෙන් ඇහුවා "ඔයාලා ඔය කොහෙද යන්නේ කියලා".



සඳුනිගේ යහළුවෝ සහ සඳුනි සුරංගනාවියට කිව්වා "අපි යන්නේ පළතුරු කඩාගෙන එන්න කියලා". ඉන්පසු සුරංගනාවිය කිව්වා "ආය ඔයාලා පලතුරු කඩාගෙන එන්න ඕනේ නෑ" කියලා මම ඔයාලාට පොඩි දෙයක් දෙන්නම් කිව්වා.

ඉන්පසු සුරංගනාවිය සඳුනිගේ අතට මායා තොප්පියක් දුන්නා. "ඔයාලට ඕන දෙයක් මේ තොප්පියෙන් ඉල්ලන්න පුළුවන්" සුරංගනාවිය කිව්වා.

සඳුනි සහ සඳුනිගේ යහළුවෝ සුරංගනාවියට ස්තූති කිරීමේ දී එතනින් කහපාට එළියක් මතු වී සුරංගනාවිය නොපෙනී ගියා. ඉන්පසු සඳුනි සහ සඳුනිගේ යහළුවෝ ඉක්මණට ගෙදර දුවගෙන ගියා. සඳුනි ගෙදර ගිය පසු අම්මාට කතා කළා. "අම්මේ අම්මේ අපි කැළෑවේ පලතුරු කඩාගෙන ඉස්සරහට යනකොට පුංචි කහ පාට එළියක් මතු වී සුරංගනාවියක් මතු වුණා. ඊට පස්සේ ඒ සුරංගනාවිය අපෙන් ඇහුවා ඔයාලා කොහෙද යන්නේ කියලා. ඊට පස්සේ අපි කිව්වා අපි යන්නේ කැලයට පලතුරු කඩන්න කියලා. ඒ සුරංගනාවිය අපිට කිව්වා ඔයාලා පලතුරු කඩන්න ඕන නෑ මම ඔයාලාට මායා තොප්පියක් දෙන්නම් කියලා". සඳුනි මුළු කතාවම අම්මාට කිව්වා. ඉන් පසු අම්මා සතුටු වුණා.

ඔන්න එකමත් එක දවසක සඳුනි සහ ඇයගේ යහළුවෝ සෙල්ලම් කර කර සිටියදී ලේන් පැටියෙක් කූඩුවෙන් බිමට වැටී සිටිනවා. ඊට පස්සේ සඳුනි ඒ ලේන් පැටියාව ගෙට ගෙනවිත් ඇය ගෙන ආ මායා තොප්පියෙන් පලතුරු සහ කිරි කෝප්පයක් මතු කලා. ඒ පලතුරු සහ කිරි කෝප්පය ලේන් පැටියාට කෑමට සහ බීමට දුන්නා.



ඉන් පසු ඒ ලේන් පැටියා පළතුරු ටික සතුටින් කා කිරි වීදුරුව බිව්වා. ඉන් පසුව එම ලේන් පැටියාව කූඩුවෙන් පරිස්සමට තිබ්බා.

**මෙයින් ගත හැකි ආදර්ශ**

සතුන්ට කරුණාව දැක්වීම හා තමන්ට ලැබුණු දෙයින් ලෝභ නැතිව අනුන්ට එයින් උපකාර කිරීම.

නිමි.....



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

**ISBN : 978-624-211-018-9**

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)